# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1,718/12 - 2011 අගෝස්තු 09 වැනි අඟහරුවාදා - 2011.08.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වන වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 19 සහ 157අ වගන්ති යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කුමාර වෙල්ගම,
ප්‍රවාහන අමාත්‍ය.

2011 අගෝස්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2011 අංක 3 දරන මෝටර් වාහන (ආසන පටි) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග,-

(අ) ඉංග්‍රීසි අකාරාදියේ අක්ෂර දෙකකට පසුව, පළාත් අක්ෂර දෙකක් හෝ “DP” යන අක්ෂර සහ එහි දක්වා ඇති අංක හතරකින් ; හෝ

(ආ) ඉංග්‍රීසි අකාරාදියේ අක්ෂර තුනකට පසුව, පළාත් අක්ෂර දෙකක් හෝ “DP” යන අක්ෂර සහ එහි දක්වා ඇති අංක හතරකින්,

සමන්විත විශේෂිත අංකයක් පවරා ඇති සහ ලියාපදිංචි කොට ඇති (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි සෑම මෝටර් වාහනයකටම අදාළ විය යුතු ය.

එසේ වුව ද, මේ නියෝගවල විධිවිධාන, එහි 1 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මෝටර් වාහන පන්තිවලට අදාළ නොවිය යුතු ය.

3. කිසිම තැනැත්තෙකු විසින්, මේ නියෝග ක්‍රියාත්මකවීමෙන් අනතුරුව, 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති වර්ගයේ බඳට සවිකොට ඇති පුද්ගල ආරක්ෂක ආසන පටි නොමැති යම් වාහනයක් විකිණීම හෝ විකිණීම සඳහා අර්පනය කිරීම හෝ විකිණීම සඳහා ඔහු සන්තකයේ තබා ගැනීම නොකළ යුතු ය.

1A - G 14900 — 835 (2011/08)

4. 2011 ඔක්තෝබර් මස 01 වන දින සිට බලාත්මක වන පරිදි, මේ නියෝග -

(අ) එම බලාත්මක වන දින සිට ලියාපදිංචි කොට ඇති සහ 2 වන නියෝගයේ (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති විශේෂිත අංකයක් පවරා ඇති සැහැල්ලු මෝටර් ලොරි, මෝටර් ලොරි සහ බර මෝටර් ලොරි සහ සැහැල්ලු මෝටර් කෝච් රථ, මෝටර් කෝච් රථ සහ බර මෝටර් කෝච් රථ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය ;

(ආ) මේ නියෝග අදාළ වන සෑම මෝටර් වාහනයකම රියැදුරු ආසනය සහ ඉදිරිපස මඟී ආසනය 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති වර්ගයේ පුද්ගල ආරක්ෂක ආසන පටි සවිකළ යුතු බවට නියම කළ යුතු ය ;

(ඇ) 2 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් මෝටර් වාහන වර්ගයකට අයත් යම් මෝටර් වාහනයක රියැදුරු ආසනයේ හෝ ඉදිරිපස ආසනයේ ගමන් ගන්නා සෑම තැනැත්තකුම 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති වර්ගයේ ආසන පටි පැළඳිය යුතු බවට නියම කළ යුතු ය.

5. මෙම නියෝග අදාළ වන්නා වූ සෑම මෝටර් වාහනයකටම සවිකළ යුතු බවට නියමිත පුද්ගල ආරක්ෂක ආසන පටියේ වර්ගය-

(අ) ඒකක තුනක් හෝ වැඩි ගණනක් සහිත බඳ ඉහළට සිටින පටියක් සහ හරස් පටිය/පටිවලින් සමන්විත විය යුතු ය ;

(ආ) 2 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති වර්ගයේ මෝටර් වාහනයක රියැදුරු ආසනයේ හෝ ඉදිරිපස මඟී ආසනයේ ගමන් කරන තැනැත්තන්ගේ ඉහළ සහ පහළ කඳ කොටස් දෙකටම ආරක්ෂාවක් ලබාදෙන ආකාරයට පැළඳිය හැකි විය යුතු ය.

6. මෙම නියෝගවල විධිවිධාන -

(අ) මීටර් 1.5 නොඉක්මවන උසක් ඇති තැනැත්තන් සඳහා ;

(ආ) මෙම නියෝගවල 7 වන නියෝගය යටතේ පුද්ගල ආරක්ෂක ආසන පටි පැළඳීමෙන් නිදහස්කර ඇති තැනැත්තන් සඳහා ;

(ඇ) ප්‍රතිවිරුද්ධ දෙසට ධාවනය කිරීම ඇතුළු මෙහෙයුම් කර්තව්‍ය කරනු ලබන වාහනවල රියැදුරන් සඳහා ;

(ඈ) 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති වර්ගයක ආසන පටියක් පැළඳීම සඳහා වෛද්‍ය හේතූන් මත යෝග්‍ය නොවන බවට යම් ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විසින් සඳහන් කරමින් එම වෛද්‍ය වෘත්තිකයා විසින් අත්සන් කරන ලද II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ වලංගු වෛද්‍ය සහතිකයක් දරනු ලබන තැනැත්තකු සඳහා,

අදාළ නොවිය යුතු ය.

එසේ වුවද,

(i) ඉහත (ආ) ඡේදය ප්‍රකාරව යම් තැනැත්තකුට ප්‍රදානය කර ඇති නිදහස් කිරීම ස්ථිර ස්වභාවයේ යම් අශක්නුතාවයක් සම්බන්ධයෙන් වේ නම්, එම තැනැත්තා විසින්, 7 වන නියෝගයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට වෛද්‍ය මණ්ඩලයකින් නිදහස් කිරීමක් ලබාගත යුතු ය. වෛද්‍ය මණ්ඩලය විසින්, එම තැනැත්තා වෙත මෙම නියෝගවල III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ii) ඉහත (ඈ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති වෛද්‍ය සහතිකය මාස හයකට වැඩි කාලයක් සඳහා නිකුත් නොකළ යුතු ය. සෑම වෛද්‍ය සහතිකයක්ම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයක ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. එම රෙජිස්ටරය IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු ය. නිදහස් කිරීම ප්‍රදානය කර ඇත්තේ යම් වෛද්‍ය සහතිකයක් සම්බන්ධයෙන් ද, එම වෛද්‍ය සහතිකය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

7. (1) 4 වන නියෝගයේ (ඇ) ඡේදයෙන් නිදහස්වීම සඳහා වූ ඉල්ලීමක්, ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු වෙත ඉදිරිපත් කළ යුතු අතර, එම වෛද්‍ය වෘත්තිකයා විසින් එයට ආධාරවන වෛද්‍ය හේතු සහ සාක්ෂි පදනම්කොට ගෙන ඉල්ලුම්කරු වෙත නිදහස් කිරීමක් ප්‍රදානය කිරීම නිර්දේශ කරමින් හෝ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් සිය නිර්දේශය වෛද්‍ය මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ නියෝගයේ (1) වන ඡේදයේ කාර්ය සඳහා, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විතවන නිලධරයන් පස්දෙනෙකුගෙන් යුත් වෛද්‍ය මණ්ඩලයක් ප්‍රවාහන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලැබිය යුතු ය.

(i) 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය මධ්‍යස්ථානය පනත යටතේ පිහිටුවන ලද ජාතික ප්‍රවාහන වෛද්‍ය මධ්‍යස්ථානයේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන වෛද්‍ය නිලධරයන් දෙදෙනෙකු,

(ii) සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය නිලධරයන් දෙදෙනෙකු,

(iii) රියැදුරකුගේ කුසලතාවය තක්සේරු කිරීම සහ රියදුරු පරීක්ෂණයක් පැවැත්වීම පිළිබඳව පුළුල් දැනුමක් ඇති මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් - ජනරාල්වරයා විසින් නම් කරනු ලබන මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු.

(2) (අ) ප්‍රවාහන විෂයය පවරා දී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වෛද්‍ය මණ්ඩලයේ සභාපතිවරයා පත්කරනු ලැබිය යුතු අතර, සභාපතිවරයා නොමැති අවස්ථාවක දී, ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(ආ) වෛද්‍ය මණ්ඩලයේ ලේකම්වරයා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු විය යුතු ය.

(ඇ) වෛද්‍ය මණ්ඩලයේ ලේකම්වරයා ඇතුළුව එම මණ්ඩලයේ ඕනෑම සාමාජිකයන් තිදෙනෙකු මගින් වෛද්‍ය මණ්ඩලයේ ගණපූරණය සංයුක්ත විය යුතු ය.

(ඈ) ලේකම්වරයා විසින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දී වෛද්‍ය මණ්ඩලයේ රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(ඉ) ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයා විසින් වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කරන ලද නිර්දේශය සම්බන්ධයෙන් කරුණු විමසීම සහ වෛද්‍ය මණ්ඩලයට අවශ්‍ය විය හැකි තවදුරටත් වූ සාක්ෂි ලබාගැනීම සඳහා වෛද්‍ය සහතිකය නිකුත් කරන ලද ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයාව කැඳවනු ලැබිය හැකි ය.

(ඊ) වෛද්‍ය මණ්ඩලය විසින් 4 වන නියෝගයේ (ඇ) ඡේදයේ විධිවිධානවලින් යම් තැනැත්තකු නිදහස් කිරීම හෝ එවැනි නිදහස් කිරීමක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකි ය.

8. මෙම නියෝගවල කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේදී (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 224 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති දණ්ඩනයට යටත් විය යුතුය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවේ නම් මිස මේ නියෝගවල :-

"අනතුර", "අත්ට්‍රැක්ටර්", "ඉඩම් වාහන" "සැහැල්ලු මෝටර් කෝච් රථය", "මෝටර් කෝච් රථය", "බර මෝටර් කෝච් රථය", "මෝටර් සයිකලය", "මෝටර් අවමංගල රථ", "බඳ පටිය", "සැහැල්ලු මෝටර් ලොරිය", "මෝටර් ලොරිය", "බර මෝටර් ලොරිය", "මෝටර් ට්‍රයිසිකලය", "මෝටර් වාහනය", "ආසන පටිය" සහ "විශේෂ කාර්ය වාහනය" යන්නට (203 වන අධිකාරය වූ) මෝටර් රථ වාහන පනතේ 240 වන වගන්තියේ ඇති අර්ථයම තිබිය යුතු ය.

## I වන උපලේඛනය

1. මෝටර් සයිකලය.
2. මෝටර් ට්‍රයිසිකලය සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය.
3. සැහැල්ලු මෝටර් ලොරිය, මෝටර් ලොරිය සහ බර මෝටර් ලොරිය.
4. සැහැල්ලු මෝටර් කෝච් රථය, මෝටර් කෝච් රථය සහ බර මෝටර් කෝච් රථය.
5. විශේෂ කාර්ය වාහනය.
6. ඉඩම් වාහන.
7. අත්ට්‍රැක්ටර්
8. මෝටර් හර්ස් රථ

## II වන උපලේඛනය

### *වෛද්‍ය සහතිකය*

ලියාපදිංචි අංකය : ................................................ දිනය : ......................................
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

නම : ....................................................................................
ලිපිනය : ....................................................................................
උපන් දිනය : .................................................................................... වයස : ....................................................
ස්ත්‍රී /පුරුෂභාවය : ...............................................................
ජා.හැ. පත් අංකය : ...............................................................
රෝගය : ....................................................................
(තාවකාලික / ස්ථිර)
අශක්නුතාවය : : ....................................................................................
................................................ පදිංචි ............................................... වන මම පහත දැක්වෙන පරිදි මෙයින් ප්‍රකාශ කර සිටිමි.

(අ) මම ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු වෙයි.
(ආ) ඉහත කී ................ යන අය මා විසින් 20 ............. දින පරීක්ෂා කරන ලදී.
(ඇ) පහත සඳහන් හේතු අනුව මා විසින් පහත සඳහන් නිගමනවලට එළඹෙන ලදී :

මම පහත දැක්වෙන පරිදි තවදුරටත් ප්‍රකාශ කර සිටිමි,

(අ) ඉහත කී .......................................... යන අය

(i) ............................... රෝගයෙන් පෙළෙමින් සිටියි.
(ii) ආසන පටි පැළඳීම සඳහා දැනට නොහැකි තත්ත්වයක සිටියි.

අත්සන් කළේ ................................................
වෛද්‍ය සුදුසුකම් ................................................
සහතික පත්‍රයේ දිනය ................................................

*සැ. යුතු ය.—* මෙම සහතිකය ඉහත සඳහන් දින සිට පමණක් (මාස හයකට නොවැඩි කාලසීමාව නිශ්චිතව දක්වන්න) .................................. දක්වා වලංගුව පවතී.

## III වන උපලේඛනය

### *I වන ආකෘතිය*

*වෛද්‍ය සහතිකය අළුත් කිරීම සඳහා වූ ඉල්ලීම*

....................................
....................................
.................................. වෙතටයි.

ජාතික හැඳුනුම්පත් අංක ............................................... දරන ............................................. පදිංචි ......................................... වන මම, .......................................... රෝගයෙන් පීඩා විඳින රෝගියෙකු වන මා වෙත ..................................... දින නිකුත් කරන ලද අංක .................................... දරන වෛද්‍ය සහතිකය අළුත් කරන ලෙස මෙයින් ඔබගෙන් ඉල්ලා සිටිමි.

අත්සන ...................................
දිනය ...................................

### *II වන ආකෘතිය*

*ආසන පටියක් පැළඳීමෙන් නිදහස් කිරීම*

වෛද්‍ය මණ්ඩලය, නිදහස් කිරීමක් සඳහා වූ ඉල්ලුම්පත්‍රය නිර්දේශ කොට ඉදිරිපත් කරන ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයා විසින් එම වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ලේඛන මත පදනම් ව ............................................................................................... පදිංචි (පූජ්‍ය)/.......................................................... (මහතා/මිය/මෙනවිය).

(i) තාවකාලික / ස්ථිර ස්වභාවයේ රෝගයක් වන ........................................................ රෝගයෙන් පෙළෙන බවට, හෝ

(ii) තාවකාලික / ස්ථිර අශක්නුතාවයක් වන අශක්නුතාවයකින් පෙළෙන බවට, සහ

(iii) මේ නියෝගවලින් නියම කොට ඇති පරිදි ආසන පටියක් පැළඳීමට ...................................... / ස්ථිරව නොහැකි බවට.

කරන ලද නිර්දේශය ස්ථිර කරන අතර, (පූජ්‍ය)/.................................................................... (මහතා/මිය/මෙනවිය) ආසන පටියක් පැළඳීමෙන් නිදහස් කරන ලදී.

.............................................
වෛද්‍ය මණ්ඩලයේ
ලේකම්වරයාගේ අත්සන.

.............................................
දිනය

## IV වන උපලේඛනය

### *වෛද්‍ය සහතික රෙජිස්ටරය*

| *ලියාපදිංචි අංකය* | *නම* | *ලිපිනය* | *ස්ත්‍රී/පුරුෂ භාවය* | *ජා.හැ.පත් අංකය* | *වලංගු කාලය* | | *වෛද්‍ය වෘත්තිකයාගේ නම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | | *සිට* | *දක්වා* | |
| | | | | | | | |

08-591

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.